සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
**General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)**

| | |
|---|---|
| **ශිල්ප කලා I, II** | **පැය තුනයි** |
| நுண்கலை I, II | மூன்று மணித்தியாலம் |
| Arts and Crafts I, II | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශිල්ප කලා I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ලාංකේය 'සිව්සැට කලාව' වර්ග කර ඇති ප්‍රධාන ප්‍රභේද දෙක වන්නේ,
(1) ශ්‍රව්‍ය හා දෘශ්‍ය කලාව ය.
(2) ගැමි කලාව හා ජන කලාව ය.
(3) ජන කලාව හා විදග්ධ කලාව ය.
(4) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව හා විදග්ධ කලාව ය.

**2.** කෙටි සරල රේඛා ඛණ්ඩයක් නිවැරදිව සම කොටස්වලට බෙදීමට කෝදුව සහ පැන්සල සමඟ භාවිත කළ යුතු ජ්‍යාමිතික උපකරණය කුමක් ද?
(1) බෙදුම් කටුව
(2) කවකටුව
(3) කෝණමානය
(4) විහිත චතුරස්‍රය

**3.** කාර්මික චිත්‍ර ඇඳීමේදී විවිධ සම්මත රේඛා වර්ග භාවිත කරනු ලැබේ. පහත රූප සටහනේ මිනුම් දැක්වීමට භාවිත කර ඇති සම්මත රේඛා වර්ගය වන්නේ,




(1) අඛණ්ඩ ඝන රේඛා ය.
(2) අඛණ්ඩ සිහින් රේඛා ය.
(3) දෙකෙළවර ඝන දාම රේඛා ය.
(4) දෙකෙළවර සිහින් දාම රේඛා ය.

**4.** කඩදාසි සඳහා ජාත්‍යන්තරව සම්මත වූ ප්‍රමාණ අනුව $A_0$ කඩදාසියකින් $A_3$ කඩදාසි කොපමණ සකස් කර ගත හැකි ද?
(1) 08 (2) 12 (3) 14 (4) 16

**5.** රූපයේ සේයාකර ඇති වෘත්ත කොටස හඳුන්වනු ලබන්නේ,




(1) වෘත්ත පාදය යනුවෙනි.
(2) ජ්‍යාය යනුවෙනි.
(3) වෘත්ත ඛණ්ඩය යනුවෙනි.
(4) කේන්ද්‍රික ඛණ්ඩය යනුවෙනි.

**6.** රූපයේ දක්වා ඇති ත්‍රිකෝණය නිවැරදිව අර්ථ දක්වා ඇති පිළිතුර කුමක් ද?




(1) ඍජු කෝණී විෂම පාද ත්‍රිකෝණයකි
(2) සුළු කෝණී විෂම පාද ත්‍රිකෝණයකි
(3) මහා කෝණී විෂම පාද ත්‍රිකෝණයකි
(4) සම කෝණී විෂම පාද ත්‍රිකෝණයකි

[දෙවැනි පිටුව බලන්න.

**7.** රූපයේ දක්වා ඇති ABCD රොම්බසයේ විකර්ණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) විකර්ණ එකිනෙක අසමාන වන අතර සෘජු කෝණිකයව සමච්ඡේදනය වේ
(2) විකර්ණ එකිනෙක සමාන වන අතර සෘජු කෝණිකයව සමච්ඡේදනය වේ
(3) විකර්ණ එකිනෙක සමාන වන අතර ශීර්ෂ කෝණ සමච්ඡේදනය වේ
(4) විකර්ණ සමාන වන අතර සම්මුඛ කෝණ සමාන වේ




**8.** සවිධි බහුඅස්‍රයක් නිර්මාණය කිරීමේ පියවර පහතින් දැක්වේ.
- දී ඇති අරය භාවිතයෙන් වෘත්තයක් ඇඳීම
- එම අරය වෙනස් නොකර වෘත්තයේ පරිධිය සමාන කොටස්වලට බෙදීම
- එම ඡේදිත ලක්ෂ්‍යයන් එකිනෙක යා කිරීම

ඉහත පියවර අනුගමනය කරමින් නිර්මාණය කරනු ලබන සවිධි බහුඅස්‍රය වන්නේ,
(1) සමචතුරස්‍රයකි. (2) පංචාස්‍රයකි. (3) ෂඩාස්‍රයකි. (4) සප්තාස්‍රයකි.

**9.** ඝන වස්තුවක මුහුණතක සැලසුම් චිත්‍රයක් පහත රූපයෙන් දැක්වේ. එම ඝන වස්තුව වන්නේ,




(1) ඝනකයකි.
(2) ප්‍රිස්මයකි.
(3) කේතුවකි.
(4) සිලින්ඩරයකි.

**10.** ඉලිප්සයක වක්‍රය මත පිහිටි ඕනෑම ලක්ෂ්‍යයක් එම ඉලිප්සයේ නාභි දෙක සමග යා කිරීමෙන් ලැබෙන රේඛා දෙකේ එකතුව සමාන වන්නේ,
(1) මහ අක්ෂයේ දිගට ය. (2) සුළු අක්ෂයේ දිගට ය.
(3) නියාමක අක්ෂයේ දිගට ය. (4) නාභි දෙක අතර දුරට ය.

**11.** ලෝකයේ පැතිරී පවතින විචිත්‍ර වර්ණ සියල්ලම, මූලික වර්ණ පදනම්ව ගොඩනැගී ඇති ඒවා ය. මූලික වර්ණ ලෙස හඳුන්වන්නේ,
(1) කොළ, නිල් සහ රතු පැහැයන් ය.
(2) නිල්, කහ සහ රතු පැහැයන් ය.
(3) කහ, රතු සහ තැඹිලි පැහැයන් ය.
(4) රතු, නිල් සහ දුඹුරු පැහැයන් ය.

**12.** සායම්කරණයේදී ඒක වර්ණ ප්‍රභේදයන් හෙවත් එකම වර්ණයේ අඩු, වැඩි පැහැයන් ලබා ගත හැක්කේ,
(1) ප්‍රාථමික වර්ණයක් හා ද්විතීයික වර්ණයක් එකට මුසු කිරීමෙනි.
(2) කිසියම් වර්ණයකට කළු හෝ සුදු වර්ණයක් මුසු කිරීමෙනි.
(3) ද්විතීයික වර්ණ දෙකක් එකට මුසු කිරීමෙනි.
(4) තෘතීයික වර්ණයකට ද්විතීයික වර්ණයක් මුසු කිරීමෙනි.

**13.** රෙදි පින්තාරු කිරීමේ දී 'සියුම් නිමා පින්සල්' (Fine Finishing Brushes) අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ වර්ණ ගැන්වීම සඳහා ද?
(1) මූලික ආලේපන ගැල්වීමට ය. (2) විශාල ප්‍රදේශ වර්ණ ගැන්වීමට ය.
(3) වර්ණ සේදුම් අවස්ථා සඳහා ය. (4) සියුම් ඉරි, තිත්, ඉම්රේඛා ඇඳීමට ය.

**14.** පිළි අලංකරණ ක්‍රියාවලියට පෙර පෙහෙකම් ද්‍රව්‍ය පෙර පිරියම්කරණයකට බඳුන් කර ගත යුතු වේ. පෙර පිරියම් ක්‍රම ලෙස භාවිතයේ පවතින්නේ,
(1) කැඳහරණය, මලහරණය සහ විරංජනය යි.
(2) කාබනීකරණය, මැලියම්හරණය සහ හුමාලකරණය යි.
(3) මැලියම්හරණය, ක්ලෝරීනීකරණය සහ වර්ගීකරණය යි.
(4) අම්ලකරණය, හුමාලකරණය සහ පසු පිරියම්කරණය යි.

**15.** රෙදිපිළි අලංකාර කිරීම සඳහා මුද්‍රණය කිරීමේ දී නියමිත ක්‍රමයකට අනුගතව සායම් සකස් කර ගැනේ. සේදරාමු මුද්‍රණයේ දී සායම්වලට උකුකුරුකාරකයක් එක් කරනු ලබන්නේ,
(1) සායම්වල දියරමය ස්වභාවය වැඩිදියුණු කර ගැනීමට ය.
(2) සායම් විසිරියාම වළක්වා ගැනීම ට ය.
(3) සායම්වල ස්ථිරතාව වර්ධනය කර ගැනීමට ය.
(4) රෙදිපිළිවලට සායම් බන්ධනය කර ගැනීමේ පහසුවට ය.

**16.** පහත සඳහන් කරුණු අතරින් සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමයට (Stencil Printing) අදාළ නොවන කරුණ තෝරන්න.
(1) එකිනෙකට සම්බන්ධ නොවන ආකාරයේ රටා තෝරා ගැනීම
(2) කැපුම් තලයකින් අවශ්‍ය කොටස් කපා ඉවත් කිරීමට හැකිවීම
(3) සායම් ඉසිනයක් හෝ ස්පොන්ජ් කැබලි භාවිතයෙන් වර්ණ ගැන්වීම
(4) සායම් දියකර ගැනීමට උණු ජලය භාවිත කිරීම

**17.** රෙදි නිෂ්පාදනයේ දී භාවිත කරන නූල් නිපදවා ගැනීමට යොදා ගන්නා කෙඳි අතරින් ස්වාභාවික ශාක කෙඳි ගණයට අයත් කාණ්ඩය තෝරන්න.
(1) රන්, රිදී, වීදුරු (2) කපු, හණ, නියඳ
(3) ලෝම, සේද, සිසල් (4) ඇක්‍රිලික්, රේයෝන්, ටෙරලින්

**18.** බතික් නිර්මාණ සිදු කිරීමේ දී අලංකාර සියුම් රේඛා ලබා ගැනීමට අවශ්‍ය වූ විටෙක, ඉටි මිශ්‍රණය සකස් කරගත යුතු වන්නේ,
(1) පැරපින් ඉටි ප්‍රමාණය වැඩි කර ගැනීමෙනි.
(2) මී ඉටි අනුපාතය වැඩි කර ගැනීමෙනි.
(3) රටදුම්මල ප්‍රමාණය වැඩි කර ගැනීමෙනි.
(4) මී ඉටි සහ රටදුම්මල සමාන අනුපාතයෙන් යෙදීමෙනි.

**19.** මැසීම, එම්බ්‍රොයිඩර් කිරීම, වර්ණාලේප කිරීම ආදියෙන් තොරව රත් කර ඇලවීම මගින් රෙදිපිළි අලංකාර කර ගැනීමට භාවිත කළ හැකි ආකාරයට වෙළෙඳපොළට පැමිණ ඇති කඩදාසි විශේෂය හඳුන්වන්නේ,
(1) වාර්නිෂ් කඩදාසි (Varnish Paper) නමිනි.
(2) වැලි කඩදාසි (Sand Paper) නමිනි.
(3) තාප බන්ධිත කඩදාසි (Heat'n Bond Paper) නමිනි.
(4) දිස්න කඩදාසි (Shining Paper) නමිනි.

**20.** කෙඳි වර්ගය අනුව නූල් කැරැල්ලක සම්මත දිග විවිධ වේ. කපු නූල් කැරලි 10 ක් නූල් රාත්තලකට අඩංගු නම්, එම නූල්වල දිග යාර කීය ද?
(1) $300 \times 10 = 3000$ කි (2) $560 \times 10 = 5600$ කි
(3) $800 \times 10 = 8000$ කි (4) $840 \times 10 = 8400$ කි

**21.** කැරලි වශයෙන් වෙළෙඳපොළෙන් ලබා ගන්නා නූල්, භාවිතයේ පහසුව සඳහා නැවත ඔතා ගැනීමක් සිදු කෙරේ. මෙසේ දික් නූල් ඔතා ගනු ලබන්නේ,
(1) දික්නූල් කුරුවලට ය. (2) හැඩනූල් කුරුවලට ය.
(3) මල් චක්‍රයට ය. (4) එතුම් රෝදයට ය.

**22.** මෙට්‍රික් අංක 10 ක් වූ තනිපට නූල් කැරලි මිටියක බර 06 Kg කි. එහි අඩංගු නූල් කැරලි ගණන කීය ද?
(1) 6 (2) 10 (3) 50 (4) 60

**23.** හැදයක් සඳහා දෙපට නූල් කැරලි 20 ක් වැය වී ඇත. කිලෝග්‍රෑම් එකකට එම දෙපට නූල් කැරලි 30 ක් අඩංගු වන්නේ නම් එම නූලේ අංකය වන්නේ,
(1) $2/60^S$ ය. (2) $2/40^S$ ය. (3) $2/30^S$ ය. (4) $2/20^S$ ය.

**24.** දිග මීටර් 60 ක් ද පළල සෙන්ටිමීටර් 30 ක් ද වූ මේස ඇතුරුම් හැදයක් විවීම සඳහා එක් සෙන්ටිමීටරයකට නූල් පොටවල් 40 ක් යොදාගෙන ඇත. එම හැදයේ ඇති මුළු දික්නූල් පොටවල් ගණන කියද?
(1) $30 \times 60 = 1800$ (2) $30 \times 40 = 1200$ (3) $40 \times 60 = 2400$ (4) $60 \times 30 \times 40 = 72000$

[හතරවැනි පිටුව බලන්න.

**25.** මෙස ඇතිරිල්ලක් විවීම සඳහා දික් නූල් දෙකක් සහ හරස් නූල් දෙකක් භාවිත කර ඇත. එම වියමන් රටාව පහත වියමන් රටා අතරින් තෝරන්න.


(1)

(2)

(3)

(4)

**26.** පහත දක්වා ඇත්තේ හැදයක් දිග්ගැස්සීමේදී භාවිත කරන උපකරණයකි. මෙය අවශ්‍ය වන්නේ කුමන කාර්යයක් සඳහා ද?



(1) හැදය සඳහා නූල් දිග්ගසා ගැනීමට ය
(2) නූල් හැදය යන්ත්‍රගත කිරීමේදී ය
(3) නූල් කැරලි නූල් කුරුවලට ඔතා ගැනීමට ය
(4) නූල් හැදයට සීරු දමා ගැනීම සඳහා ය

**27.** පහත සඳහන් ඒවායින් කලිසම් රෙදි විවීම සඳහා විශේෂයෙන් භාවිත කරන 'සරලහීරි වියමන' තෝරන්න.


(1)

(2)

(3)

(4)

**28.** අත්යන්ත්‍රයක වියන විට හරස් නූල් තදකර ගැනීම සඳහා භාවිත කරන උපාංගය හඳුන්වන්නේ,
(1) අළුව නමිනි. (2) ලීවරය නමිනි. (3) නඩාව නමිනි. (4) එතුම් රෝදය නමිනි.

**29.** තාක්ෂණික දියුණුවත් සමග නිපදවන ලද ජවනඩා යන්ත්‍රය අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිෂ්පාදන වේගය වැඩිම විවීමේ යන්ත්‍රයයි. පහත දැක්වෙන කරුණු අතරින් එම යන්ත්‍රයට අදාළ නොවන කරුණ තෝරන්න.
(1) වැඩි වේගයකින් විවීම සඳහා අත්වැලක් සවි කර ඇත
(2) කුඩා ප්‍රමාණයේ හැද විවීමට අපහසුය
(3) විවීමේදී වාඩිවීමට ආසනයක් යොදා ඇත
(4) පුඩුවැල් පේළි එසවීම ලීවර මගින් සිදු කෙරේ

**30.** යන්ත්‍රගත කර ගන්නා හැදයේ නූල් සම ආතතියකින් තබා ගැනීමටත්, හරස්නූල් තදකර ගැනීමටත්, හැකිවන සේ අළුවට, පනාව (Reed) සවිකර භාවිතයට ගැනේ. පහත දැක්වෙන උපකරණ අතුරින් පනාව තෝරා දක්වන්න.


(1)

(2)

(3)

(4)

**31.** විවිධ පාෂාණ ජීර්ණ ක්‍රමවේද මත නිපදවෙන මැටිවල අන්තර්ගත මූලද්‍රව්‍ය වන්නේ,
(1) නයිට්‍රජන්, ඔක්සිජන් සහ ටයිටේනියම් ය.
(2) කැල්සියම්, කාබන්ඩයොක්සයිඩ් සහ නයිට්‍රජන් ය.
(3) ටයිටේනියම්, කැල්සියම් සහ ඇලුමිනියම් ය.
(4) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන්ඩයොක්සයිඩ් සහ ජලය ය.

[පස්වැනි පිටුව බලන්න.

**32.** රතු මැටි භාණ්ඩ, උළු, ගඩොල්, මුළුතැන්ගෙයි භාවිත වන මැටි භාණ්ඩ ආදිය නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කළ යුතු මැටි විශේෂය වන්නේ,
(1) ප්‍රාථමික මැටි ය. (2) ද්විතියික මැටි ය. (3) මයිකාමය මැටි ය. (4) කෙඔලින් ය.

**33.** මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී මැටිවල පවත්නා සුවිකාර්යතා ගුණය අධික අවස්ථාවක නියම ප්‍රමිතියට සකස්කර ගැනීමට කළ යුත්තේ,
(1) යකඩ ප්‍රතිශතය අඩු කෙඔලින් වැනි මැටි වර්ගයක් මිශ්‍ර කර ගැනීම යි.
(2) නම්‍යතාවෙන් ඉහළ තලප මැටි වැනි මැටි වර්ගයක් මිශ්‍ර කර ගැනීම යි.
(3) සවිවරතා ගුණයෙන් යුතු බෝල මැටි වැනි මැටි වර්ගයක් මිශ්‍ර කර ගැනීම යි.
(4) වැලි, ෆෙල්ඩ්ස්පාර් වැනි නොඇලෙන සුලු ද්‍රව්‍ය මිශ්‍ර කර ගැනීම යි.

**34.** මහා පරිමාණ සෙරමික් කර්මාන්තයේදී මැටි පදම් කිරීම සඳහා එකතු කරනු ලබන ජලයේ වැඩි ප්‍රමාණය ඉවත් කිරීම සඳහා භාවිත කරනු ලබන යන්ත්‍රය වන්නේ,
(1) ජෝ ක්‍රෂර් යන්ත්‍රය යි. (2) ෆිල්ටර් ප්‍රෙෂ් යන්ත්‍රය යි.
(3) පග්මිල් යන්ත්‍රය යි. (4) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය යි.

**35.** මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා කඩදාසි, කැබලිවලට ඉරා අලවා ගැනීමෙන් ද විසිතුරු නිර්මාණ සකස්කර ගැනේ. එම ක්‍රමය හඳුන්වන්නේ,
(1) කොලාජ් ක්‍රමය ලෙසට ය. (2) ඩෙකෝපාජ් ක්‍රමය ලෙසට ය.
(3) පල්ප් ක්‍රමය ලෙසට ය. (4) ස්ටෙන්සිල් ක්‍රමය ලෙසට ය.

**36.** ගිනිකොත්, පෝරණු ගඩොල්, උඳුන් කොටස් ආදිය නිපදවීමේදී භාවිත කරනු ලබන මැටි වර්ගය වන්නේ,
(1) යකඩ ප්‍රතිශතය අඩු කෙඔලනයිට් මැටි ය. (2) මැග්නීසියම් අඩංගු කළු මැටි ය.
(3) ගිනි මැටි හෙවත් නොවිරෙන මැටි ය. (4) මයිකා මිශ්‍ර මයිකාමය මැටි ය.

**37.** එකම හැඩයේ, එකම ප්‍රමාණයේ මැටි භාණ්ඩ රාශියක් අවශ්‍ය අවස්ථාවක දී භාවිත කළ යුතු නිෂ්පාදන ක්‍රමය වන්නේ,
(1) සකපෝරුවේ ඉදිකිරීම යි. (2) තහඩු ක්‍රමය යි.
(3) දරණු ක්‍රමය යි. (4) අච්චු ක්‍රමය යි.

**38.** දේශීය පෝරණුවක මැටි භාණ්ඩ පිලිස්සීමේදී යෙදිය හැකි උෂ්ණත්ව පරාසය කුමක් ද?
(1) 850 ℃ - 900 ℃ (2) 900 ℃ - 1100 ℃
(3) 1100 ℃ - 1200 ℃ (4) 1250 ℃ - 1350 ℃

**39.** විවිධ ක්‍රමවලට ගොඩනගන ලද මැටි බඳුන් කිහිපයක රූප සටහන් පහතින් දක්වා ඇත. ඒවායේ නිෂ්පාදන ක්‍රම අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.



(1) තහඩු ක්‍රමය, අච්චු ක්‍රමය, දරණු ක්‍රමය, සකපෝරුවේ ඉදිකිරීම
(2) දරණු ක්‍රමය, තහඩු ක්‍රමය, අච්චු ක්‍රමය, සකපෝරුවේ ඉදිකිරීම
(3) අච්චු ක්‍රමය, තහඩු ක්‍රමය, දරණු ක්‍රමය, සකපෝරුවේ ඉදිකිරීම
(4) සකපෝරුවේ ඉදිකිරීම, තහඩු ක්‍රමය, දරණු ක්‍රමය, අච්චු ක්‍රමය

**40.** මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඒවා අලංකරණය කිරීමේ විවිධ අවස්ථා පවතී. ඒ අනුව කැටයම් කැපීම සිදු කරනු ලබන්නේ කුමන අවස්ථාවේදී ද?
(1) නිෂ්පාදන අවස්ථාවේ දී ය
(2) හම් පදම් අවස්ථාවේ දී ය
(3) පළමු පිලිස්සීමෙන් පසු අවස්ථාවේ දී ය
(4) භාණ්ඩය හොඳින් වියළී ඇති අවස්ථාවේ දී ය

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

84 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப்) பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

ශිල්ප කලා I, II
நுண்கலை I, II
Arts and Crafts I, II

## ශිල්ප කලා II

✳ **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** 'ප්‍රාදේශීය සම්පත් ඇසුරින් නිෂ්පාදන' මැයෙන් ඔබ ප්‍රදේශයේ දේශීය කර්මාන්ත ශිල්පීන් ඔවුන්ගේ නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වාදීමටත්, ඒවා අලෙවිකර ගැනීමටත් වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

(i) ප්‍රදර්ශනය පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමට යෝග්‍ය පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා ඇරයුම් කිරීමට අපේක්ෂිත ආරාධිතයන්ට යැවීමට, ආරාධනා පතක මුහුණතකට සුදුසු නිර්මාණයක් ඇඳ දක්වන්න.

(iii) ප්‍රදර්ශන දිනයේ සංවිධායක මණ්ඩලයට පැලඳීමට යෝග්‍ය නිල ලාංඡනයකට සුදුසු නිර්මාණයක් ඇඳ දක්වන්න.

(iv) ප්‍රදර්ශනයේ අලෙවියට තබන ගමන් මලු නිර්මාණයට යොදා ගත හැකි පරිසර සම්පත් **දෙකක්** නම් කරන්න.

(v) රාත්‍රී කාලයේ පවත්වන සංගීත සැඳෑවට සහභාගී වන ගායන ශිල්පීන්ගේ ඇඟළුම්වලට දීප්තිමත්භාවයක් ගෙනදීමට අවශ්‍ය වේ. එසේ ඇඳුම් හැඩ ගැන්වීමට යොදා ගත හැකි මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(vi) රංගනයෙන් දායක වන ශිල්පීන්ගේ ඇඳුම් එකම ආකාරයේ මෝස්තර යෙදූ ඒවා විය යුතුය. එම ඇඳුම් අලංකරණය කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(vii) කතිර මැහුම් රටාවෙන් නිම කළ විචිත්‍රවත් නිර්මාණයක් අලෙවි කරනු ලබන්නේ රු. 2500 කට ය. ඒ සඳහා 10% වට්ටමක් ලබා දෙන්නේ නම් එය මිලදී ගැනීමට වැය කළ යුතු මුදල ගණනය කරන්න.

(viii) නර්තන ශිල්පීන්ගේ ගෙල හැඩ ගැන්වීමට මැටියෙන් සකස් කළ හැකි නිර්මාණයක් චිත්‍රණය කරන්න.

(ix) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ නිර්මාණ ඇගයීමේ දී ජයග්‍රාහකයින්ට ලබාදීමට අපේක්ෂිත ලී ආශ්‍රිත සමරුඵලකයකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න.

(x) ප්‍රදර්ශන භූමියේ දී රස කැවිලි අලෙවිකරුවන්ට තම රස කැවිලි ඇසිරීමට භාවිත කළ හැකි නිර්මාණශීලී ඇසුරුමක ආකෘතියක් ඇඳ දක්වන්න.

**2.** ශිල්ප කලා විෂයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී සැලසුම් චිත්‍ර ඇඳීමට හිමිවන්නේ විශේෂ තැනකි.

(i) සරුංගලයක් සකස් කිරීමට යොදා ගත හැකි ජ්‍යාමිතික හැඩ තල **දෙකක්** ඇඳ දක්වන්න.

(ii) සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ නිර්මාණ ක්‍රියාවලියේ දී සකසනු ලබන පංචාස්‍ර බෝලය සඳහා පාදයක දිග 4 cm ක් වූ සවිධි පංචාස්‍රය නිර්මාණය කරන්න.

(iii) මංගල කේක් ඇසුරුමකට භාවිත කළ හැකි ඝනකාභ හැඩැති පෙට්ටියක් සඳහා දී ඇති මිම් භාවිත කර විකසන චිත්‍රය අඳින්න.

පෙට්ටියේ උස - 6 cm
පෙට්ටියේ දිග - 4 cm
පෙට්ටියේ පළල - 2 cm

[හත්වැනි පිටුව බලන්න.

**3.** රෙදිපිළි අලංකාර කර ගැනීම සඳහා මැහුම් ක්‍රම, පැච්වර්ක් ක්‍රම, මුද්‍රණ ක්‍රම වැනි බහුවිධ ක්‍රම භාවිතයට පැමිණ ඇත.

(i) විසිතුරු මැහුම් ක්‍රමයක් ලෙස භාවිත කෙරෙන දම්වැල් මැස්ම රූප සටහනකින් ඇඳ දක්වන්න.

(ii) කඩදාසි මාධ්‍ය භාවිතයෙන් සකස් කර ගත හැකි ගෘහ අලංකරණ නිර්මාණයක් නම් කර එම නිර්මාණය සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(iii) ළදරු ඇඳුමක් අලංකාර කර ගැනීමට සුදුසු ආකාරයේ සිදුරු පත් මුද්‍රණයට (Stencil Printing) භාවිත කළ හැකි මෝස්තරයක් ඇඳ කපා ඉවත් කළ යුතු කොටස් සේයා කර දක්වන්න.

**4.** සාරි රෙදි සාම්පලයක් වියා ගැනීම සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූප සටහන සහිත විස්තරයක් පහත දැක්වේ.




* හැදයේ දිග මීටර් 100 කි.
* හැදයේ පළල සෙන්ටිමීටර් 40 කි.
* එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 80 කි.
* දික් නූලේ අංකය $2/80^{S}$ ක් වේ.

(i) සාරි විවීමට සුදුසු වියමන් රටා **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කරන ලද වියමන් රටා අතුරින් **එක්** වියමනක් ප්‍රස්තාර ගත කර දක්වන්න.

(iii) හැදය විවීමට අවශ්‍ය $2/80^{S}$ දික් නූල් ප්‍රමාණය ගණනය කරන්න.

**5.** රෙදිපිළි නිෂ්පාදනය සඳහා විවිධ යන්ත්‍ර වර්ග භාවිතයේ ඇත.

(i) පේෂ කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලිය තව දුරටත් වේගවත් කිරීම සඳහා නිපදවා ඇති යන්ත්‍රය නම් කරන්න.

(ii) නූල් එතීමේ උපකරණ කට්ටලය නම් කර ඒ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(iii) විසිතුරු පටි විවීම සඳහා භාවිතයට ගන්නා හැඩ පෙත්තක (Tablet) රූප සටහනක් ඇඳ, නූල් ඇද ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**6.** මැටි භාණ්ඩ නිපදවීම සඳහා විවිධ ක්‍රම භාවිත කෙරේ.

(i) මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම **දෙකක්** නම් කරන්න.

(ii) මැටි භාණ්ඩ නිපදවීමේදී සච්ඡරතා ගුණයේ ඇති අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(iii) පිලිස්සීමෙන් පසු මැටි භාණ්ඩවල ඇති වන වෙනස්කම් **හතරක්** දක්වා ඒවා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

**7.** සභ්‍යත්වයට පා තැබූ දා සිටම මිනිසා තමා වටා ඇති පරිසරය අලංකාරව පවත්වා ගැනීමට උත්සුක විය.

(i) ශ්‍රී ලාංකේය ඉතිහාස තොරතුරු අනුව අනුරාධපුරයේ උද්‍යාන අලංකරණ නිර්මාණ තිබූ බවට සාක්ෂි **දෙකක්** දක්වන්න.

(ii) මූර්ති ගොඩනැගීමේ දී භාවිත කෙරෙන අර්ධ උන්නත් නිර්මාණ පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න.

(iii) උද්‍යාන අලංකරණ ශිල්පියකු විසින් අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම **දෙකක්** නම් කර ඒවා පිළිබඳ කෙටි සටහන් ඉදිරිපත් කරන්න.

* * *